www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සසපය, සිවප්‍රගාසම් මරියදාස්ගේ ඝාතකයන්ට එරෙහිව පියවර ගතයුතු බව යලි කියාසිටියි

## Sri Lankan SEP renews demand for action against killers of Sivapragasam Mariyadas

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**
**2006 නොවැම්බර් 13**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ආධාරකරුවෙකු වූ සිවප්‍රගාසම් මරියදාස්, නැගෙනහිර ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයේ දී ඝාතනය කිරීමේ පටන් තෙමසක් ගතවී ඇත.

සසපය හා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ඔහුගේ ඝාතකයන් අත්අඩංගුවට ගෙන නඩු පවරන ලෙසට බල කරමින් ජාත්‍යන්තරව දියත්කල උද්ඝෝෂනයෙන්, ශ්‍රී ලංකාවේ පොලීසියට පරීක්ෂනයක් ආරම්භ කිරීමට බලකෙරුනි. කෙසේ වුවත් මේ දක්වා ම, සැකකරුවන් අත්අඩංගුවට ගෙන හෝ මූලික සාක්ෂ්‍ය මත පරීක්ෂන පවත්වා නැත.

හේතුව පැහැදිලිය. සියලු සාක්ෂ්‍ය යොමු වී ඇත්තේ ආරක්ෂක හමුදාවන්ගේ සම්බන්ධය වෙත ය. සසපය සිය උද්ඝෝෂනය දියත් කරමින් අනතුරු ඇඟවූ පරිදි, මිලිටරිය හා එයට සම්බන්ධ ඝාතක කල්ලිවල පැහැරගැනීම් හා මිනීමැරීම් වසං කිරීම පිලිබඳව පොලීසිය නම් දරා ඇත.

ශ්‍රී ලංකාවේ මරියදාස්ගේ ඝාතකයන් සොයා දඬුවම් දියයුතු බවට කරන ඉල්ලීම් දෙගුන තෙගුන කරන ලෙස සසපය ලංකාවේ කම්කරු පන්තියෙන් ද, ලෝසවෙඅ ජාත්‍යන්තර පාඨකයන්ගෙන් ද ඉල්ලා සිටියි. අහිංසක සිවිල් වැසියන් ඝාතනය කර එහි වගකීමෙන් බේරී සිටීමට ආරක්ෂක හමුදාවන්ට ලැබී ඇති හැකියාව අපගේ උද්ඝෝෂනය මගින් අභියෝගයට ලක් කර තිබේ. වසර ආරම්භයේ පටන් ම ඝාතනයන් හා "අතුරුදහන් වීම්" පිලිබඳ පැමිනිලි සිය ගනනක් මිනිස් අයිතිවාසිකම් සුරැකීමේ සංවිධාන වෙත ලැබී තිබේ.

මෙම ඝාතනයන්, රටේ දෙමල සුලුතරය ත්‍රස්ත කිරීමේ ද, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධය යලි ඇවිලවීමේ ද, ආන්ඩුවේ උත්සාහයේ නොවෙන් කල හැකි සාධකයකි. ශ්‍රී ලංකා රජයේ සිංහල අධිපතිවාදයේ ද, එල්ටීටීඊයේ දෙමල බෙදුම්වාදයේ ද, සියලු වාර්ගික දේශපාලනයට මෙන්ම යුද්ධයට ද මරියදාස්ගේ විරුද්ධත්වය ඔහු, විශේෂිත ඉලක්කයක් වීමට හේතු විය.

ජුලි 26 දින, මාවිල්ආරු සොරොව්ව අල්ලා ගැනීම සඳහා ආන්ඩුව දියත් කල ප්‍රධාන ආක්‍රමනයෙන් පසුව අගෝස්තු 07 දින මරියදාස් මරාදමනු ලැබිනි. එල්ටීටීඊය ප්‍රතිප්‍රහාරයක් මගින් මුත්තූර් නගරයෙන් කොටසක් අල්ලාගත් අතර ඉන් නගරයේ පාලනය අත් කර ගැනීම සඳහා රුදුරු සටනක් ඇවිල ගියේ ය. මරියදාස් ජීවත්වූ මුල්ලිපොතන කුඩා නගරය ද ඇතුලත් මුලු ප්‍රදේශය ම, ආරක්ෂක හමුදාවන්ගෙන් ගහන ය.

කාලයක් ඡායාරූප හා සන්නිවේදන මධ්‍යස්ථානයක් පවත්වා ගෙන ගිය මුල්ලිපොතනට මරියදාස් පදිංචියට පැමිනියේ මෑතක දී ය. ඔහු බිරිය වන ස්ටෙලා ක්‍රිෂාන්ති හා තුන් අවුරුදු වියේ පුතා ද සමග නිවසේ සිටිය දී පස්වරු 9.30ට පමන යමෙක් ඔහුගේ නම කියා කථා කල විට ඔහු දොරහැර බැලීය. ඝාතකයා කිහිප වතාවක් ඔහුට වෙඩි තබා මාර්ගයේ නතරකර තිබූ යතුරු පැදියක නැගී පලා ගියේ ය.

සැප්තැම්බර් 5 දින සිය ප්‍රකාශනය මගින් සසපය පැහැදිලි කලේ මෙයට බෙහෙවින් ම වග කිව යුත්තේ ආරක්ෂක හමුදාවන් හා ඔවුන්ගේ පැරා මිලිටරි සගයන් බව ය. ඝාතනය සිදු කිරීමේ නිපුනත්වය ද, ඝාතකයන් ඔහුගේ නම දැනසිටීම මෙන් ම මුර සංචාරක සෙබලුන් මගහැර මුර කපොල්ල හරහා පලායාමත්, යන කාරනා සියල්ල ඉඟි කරන්නේ මිලිටරියේ සම්බන්ධයයි. වැඩි දුර සාක්ෂ්‍යවලින් මෙම නිගමනය සනාථ කරයි.

### මරන තර්ජනයක්

පොලිසිය හා මිලිටරිය සමග සමීපව කටයුතු කරන ග්‍රාමාරක්ෂක බලඇනියේ භටයෙකුගෙන්, සිව් මසකට පමන පෙර මරියදාස්ට මරන තර්ජනයක් එල්ලවිය. අප්‍රේල් 11 දින මුල්ලිපොතනේ රාජකාරියේ නියුතු ග්‍රාමාරක්ෂකයෙක් මරියදාස්ගේ සන්නිවේදන මධ්‍යස්ථානයට පැමිනියේ ය. ප්‍රදේශය පිලිබඳව එල්ටීටීඊයට තොරතුරු සපයන බවට ඔහු මරියදාස්ට චෝදනා කල අතර ඔහු ඝාතනය කරන බවට විවෘතවම තර්ජනය කලේ ය.

එල්ටීටීඊ ප්‍රහාරයකට හසු වූ බස්රියක් පුපුරා නාවික භටයන් 11 දෙනෙක් ජීවිතක්ෂයට පත් වූ දින ඒ උනුසුම මධ්‍යයේ ම මරන තර්ජනය ද එල්ල විය. එය සිදු වූයේ මුල්ලිපොතන සිට කි.මී. 10ක් පමන දුර, ත්‍රිකුනාමලය - හබරන මාර්ගයේ තඹලගමුව නම් ස්ථානයට නුදුරිනි. අනෙකුත් ප්‍රහාරයන්හි දී මෙන් ම ආරක්ෂක හමුදාවන් ප්‍රතික්‍රියා කලේ, ප්‍රදේශයේ දෙමල වැසියන් ත්‍රස්ත කරමින් හා "එල්ටීටීඊ සැකකරුවන්ට" තර්ජනය කරමිනි.

දින කිහිපයකට පෙර, එල්ටීටීඊයට හිතවත් ප්‍රමුඛ පෙලේ දේශපාලඥයෙකු වූ වී. විග්නේශ්වරන්, ත්‍රිකුනාමලයේ දී වෙඩිතබා ඝාතනය කරනු ලැබිනි. ඔහුගේ ඝාතනය සිදු වූයේ මිලිටරියේ අධි ආරක්ෂිත කලාපය තුල, හමුදා මුර කපොලු ආසන්නයේ වුවත් ඝාතකයා බෙරී පලාගියේ ය. පසු ගිය දෙසැම්බරයේ දී, නාඳුනන තුවක්කුකරුවන් විසින් ඝාතනය කල පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝසප් පරරාජසිංහම් වෙනුවට පත්කිරීමට නියමිතව සිටි විග්නේශ්වරන්, ඝාතනය කිරීම විශේෂයෙන්ම ප්‍රකෝපකාරී ය.

මරියදාස් සිය සන්නිවේදන මධ්‍යස්ථනය පවත්වා ගෙන ගිය ගොඩනැගිල්ලේ අයිතිකරු වූ ජයවීරට තර්ජනය ගැන සඳහන් කල අතර පොලිසිය වෙත විධිමත් පැමිනිල්ලක් නොකලේ ය. එමෙන්ම ඔහු සිය බිරිඳටත් සහෝදරයන් වන ජේසුදාස් හා සිවප්‍රගාසම් බෙනඩික්ට් වෙත ද මේ ගැන දැනුම්දුන්නේ ය. විශ්‍රාමික ග්‍රාම නිලධාරිවරයෙකු වූ ජයවීර සසපයට ප්‍රකාශ කලේ අන්වර්ථයෙන් "ටොම්බා" ලෙස හඳුන්වන ග්‍රාමආරක්ෂකයා, මරියදාස්ගේ ව්‍යාපාරික ස්ථානය කුඩු කරන බවට ද තර්ජනය කල බවයි.

## අනෙකුත් ඝාතන

අගෝස්තු මස මුල පැවති වාතාවරනය බෙහෙවින්ම ආතති සහගත විය. මාවිල්ආරු සහ මුත්තූර්හි සටන් ඇවිලෙමින් තිබුනි. කාලතුවක්කු හා මල්ටි බැරල් රොකට් මගින් මිලිටරිය මුත්තූර් වෙත එල්ල කල ම්ලේච්ඡ බෝම්බ ප්‍රහාර හමුවේ මුස්ලිම් වැසියන් බහුතරයක් වූ දසදහස් ගනනක් පලා ගියහ. යාබද ප්‍රදේශයන්හිදී ආරක්ෂක හමුදාවන්, එල්ටීටීඊයට හිතවත්කම් දක්වන්නේ යයි සැකකරන ඕනෑ ම අයෙකුට එරෙහිව දඩයමක් ගෙන ගියේ ය.

අගෝස්තු 04 දින, මුල්ලිපොතනේ වාසුදේවන් නමැති ත්‍රී වීලර් රියදුරා නොහඳුනන තුවක්කුකරුවන් විසින් ඝාතනය කලහ. ඔහුගේ රිය කන්තලේ බලා යාම සඳහා කුලියට ගෙන තිබුනි. මාධ්‍ය වාර්තාවලට අනුව ඔහුගේ වාහනය යතුරුපැදියකින් ලුහුබැඳ ගිය දෙදෙනෙක් ඔහුට වෙඩි තබා මරා දැමී ය. මෙම ඝාතනයන් අයුක්ති සහගත අපරාධයන් ලෙස හෙලා දකිමින් මරියදාස් ගත් ආකල්පය නගරය තුල රහසක් නොවී ය.

අගෝස්තු 05 දින හමුදාව මුත්තූර් නගරය යලි අත් කර ගත්හ. ප්‍රන්සයේ ඒසීඑෆ් ආධාර ආයතනයට සම්බන්ධ ප්‍රදේශයේ කම්කරුවන් 17 දෙනෙක්, නගරය තුල පිහිටි එම කාර්යාල භූමියේ මරා දමා තිබිය දී සොයා ගනු ලැබින. එක පෙලට තිබුනු සිරුරු 15ක, ඝාතන ශෛලියට අනුව හිසට වෙඩිතැබූ තුවාල තිබුනි. අනෙක් දෙදෙනාගේ පිටුපසට වෙඩි තබා තිබුනි. ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්) අගෝස්තු 30 දින විධිමත් පරිදි ප්‍රකාශ කලේ ඝාතනයන් සඳහා මිලිටරිය වගකිවයුතු බවයි.

අගෝස්තු 07 දින මරියදාස් ඝාතනය කෙරුනි.

## තරකල ආරක්ෂාව

රටේ උතුරු හා නැගෙනහිර දශක දෙකක් තිස්සේ යුද කලාප ලෙස පැවතුනි. මිලිටරිය කටයුතු කරන්නේ යටත් කිරීමේ ආක්‍රමනික හමුදාවක් ලෙස ය. ප්‍රදේශය පුරා ම මිලිටරි කඳවුරු හා අධි ආරක්ෂිත කලාප පිහිටා ඇත. 2002 සටන් විරාමයෙන් පසුව ආරක්ෂක කටයුතු ලිහිල්වුවද, ආන්ඩුව විසින් දිවයින යලි යුද්ධයට ඇද දැමීමේ තතු තුල, මෙම වසරේ එය යලිත් තර කරනු ලැබිනි. මාර්ග බාධක, මුර කපොලු හා මුර සංචාර සුලභ දසුනකි. මිලිටරි ඔත්තු සේවා බෙහෙවින් ක්‍රියාශීලීය.

අගෝස්තු මුල් දිනවල, මුල්ලිපොතනේ ආරක්ෂක හමුදා, දැඩි සුපරීක්ෂාකාරිත්වයක තබා තිබුනි. මරියදාස්ගේ නිවස පිහිටා තිබුනේ, මුත්තූර්වල සිට පලා ආ ජනතාව රැඳවූ අනාථ කඳවුරක් බවට පත් කල අල්හිජ්රා මුස්ලිම් පාසැල ආසන්නයේ ය. එම පෙදෙස, ග්‍රාමාරක්ෂකයන් හා පොලිසිය විසින් දවසේ 24 පැයේ ම ආරක්ෂා කරනු ලැබිනි.

මරියදාස්ගේ නිවසේ සිට මීටර් 500 නුදුරින් කුඩා නගරය මධ්‍යයෙහි පොලීසිය ද, ග්‍රාමාරක්ෂකයන් ද, මිලිටරිය ද රඳවා තිබුනි. එතැන් සිට කිලෝමීටරයකට නුදුරින් හමුදා කඳවුරක් පිහිටා තිබුනි. නගරයට පිවිසෙන මාර්ගය දෙපැත්තෙහි ම, හමුදා හා පොලිස් මුර කපොලු පිහිටා තිබුනි. ත්‍රිකුනාමලය දෙසට තඹලගමුව ද, කන්තලේ දෙසට "91 වැනි සැතපුම් කනුව" ද, පිහිටියේ ය. ත්‍රිකුනාමලය-කන්තලේ මාර්ගයෙහි තවත් මුර කපොලු දෙකක් පිහිටා තිබේ.

ආරක්ෂාව තර කොට තිබූ තත්වය තුල, යතුරු පැදියේ ගමන් ගත් දෙදෙනාව හසු නොවී පලායාමට හැකිවිය.

## ප්‍රමාද වූ පොලිස් පරීක්ෂනය

ඝාතනයෙන් දෙමසකටත් වැඩි කලක් ඉක්මගිය තැන, කන්තලේ පොලිස් ස්ථානයේ විශේෂ අපරාධ විමර්ෂන අංශයේ පොලිස් පරීක්ෂක සී.ඒ. රොඩ්රිගෝ, මරියදාස්ගේ බිරිඳ හා බාල සොහොයුරා අමතා කියා

සිටියේ පරීක්ෂනය ප්‍රමාද වීම පිලිබඳ පැමිනිලි ගනනාවක් පොලිසිය වෙත ලැබීමෙන් පසු පරීක්ෂනය මෙහෙයවීම තමාට පවරා ඇති බවයි. අවසානයේ දී, ඔක්තෝබර් 17 දින ඔහු, මරියදාස්ගේ බිරිඳ වන ක්‍රිෂාන්තිගෙන් විධිමත් ප්‍රකාශනයක් සටහන් කර ගත්තේ ය.

ඉන් පසුව පරීක්ෂනය, කන්තලේ පොලිසියේ කොටාවිආරච්චි නමැති වෙනත් පරීක්ෂකවරයෙකුට පවරා ඇත. පසු ගිය සතියේ දී සසපය විසින් ඔහු ඇමතූ තැන, පරීක්ෂනය සම්බන්ධ කිසිදු තොරතුරක් සැපයීම ප්‍රතික්ෂේප කල ඔහු වඩාත් උත්සුක වූයේ, සසපය සොයාගෙන ඇත්තේ කුමක් දැයි දැන ගැනීමට ය. "අප සැකකරුවන් සොයමින් සිටිමු. ඔබ යමක් දන්නෙහි ද? කිසියම් හෝඩුවාවක් ඔබ සතු ද? එසේ නම් මට දන්වන්නැ"යි ඔහු ඇඟ බේරාගෙන ප්‍රකාශ කලේ ය.

ඔහුගේ සහායක සැරයන් බන්ඩාර, සසපයට ප්‍රකාශ කලේ සිදුව ඇති ප්‍රගතිය ඉතා සුලු බවය. පොලිසිය, මරියදාස්ගේ සන්නිවේදන මධ්‍යස්ථානයේ සේවකයන් දෙදෙනෙකුගෙන් ප්‍රකාශ සටහන් කර ගත්ත ද ඔවුන් සතුව වැදගත් හෝඩුවාවක් නොතිබුනු බව ඔහු ප්‍රකාශ කලේ ය. තඹලගමුව පොලිස් ස්ථානයේ කාර්යභාර නිලධාරී ඩී.පී.පී. රාමනායක ද එම කතාව ම පැවසී ය. තඹලගමුව පොලිසිය මරියදාස්ගේ අසල්වැසියෙකුගෙන් හා ඔහුගේ කුලී නිවසෙහි අයිතිකරුගෙන් වෙන වෙනම ප්‍රකාශ දෙකක් ලබාගෙන තිබේ. එහෙත් ඒවායේ මිනීමරුවන් ගැන "හෝඩුවාවක්" සඳහන් නොවන බව ඔහු පැවසී ය.

එහෙත් ආරම්භයේ සිටම "පරීක්ෂනය" අඩාල කර තිබුනි. සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස් නීතිපති එස්.සී. කමලසබේසන් වෙත යැවූ ලිපියෙන් පෙන්වා දී ඇති පරිදි, නිසි බලතල නොමැතිව මරියදාස්ගේ සිරුර එය තිබුනු ස්ථානයෙන් ඉවත්කිරීම මගින්, තඹලගමුව පොලිසිය, ප්‍රාථමික නීති පරිපාටිය උල්ලංගනය කර ඇත. ආරක්ෂක හේතුන් මත එම ස්ථානයට නොයන ලෙස පොලිසිය පරීක්ෂනය සිදු කල මහේස්ත්‍රාත්වරයාට ද උපදෙස් දී ඇත.

පොලිසිය හිතාමතාම ගාටමින් සිටියි. ඔවුන්, හිස් පතරොම් කොපු හතරක් හා ලේ සාම්පල් උසාවියට ඉදිරිපත් කර ඇත ද, සාක්ෂ්‍ය විභාග කිරීම සඳහා රජයේ රසපරීක්ෂක වෙත යොමු කිරීමට තවමත් අවසර ලබාගෙන නැත. හිස් පතරොම් කොපු පරීක්ෂනයකට ලක් කිරීම, මරියදාස්ගේ ඝාතකයන් යොදාගත්තේ කුමන වර්ගයේ ගිනි අවියක් දැයි තීරනය කිරීමේ දී ඉතා වැදගත් වේ.

සාක්ෂ්‍යකරුවන් සොයා ප්‍රකාශ සටහන් කර ගැනීම සඳහා පොලිසිය, බැරෑරුම් උත්සාහයක නිරත වී නැත. මරියදාස්ගේ මිනීමැරුම ගැන පොලිසියට දැනුම්දුන් ග්‍රාමාරක්ෂක ලලිත්ගෙන් තවමත් සාක්ෂ්‍ය කැඳවා නැත. මරියදාස්ට එල්ලවූ මරන තර්ජන ගැන සොයා බැලීමට කිසිදු උත්සාහයක් දරා නැත. මරියදාස්ගේ සන්නිවේදන මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ලේ හිමිකරුවන ජයවීරගෙන් ප්‍රකාශයක් ලබා ගෙන නැත. අගෝස්තු 07 දින රාත්‍රියේ මුල්ලිපොතන හා විවිධ මුර කපොලුවල රාජකාරියේ නියුතුව සිටි පොලිසියෙන්, ග්‍රාමාරක්ෂකයන්ගෙන් හා සොල්දාදුවන්ගෙන් ප්‍රශ්න කර නොතිබීම අර්ථභාරී ය.

"සැකකරුවන්" කිසිවෙකුත් නැත්නම් එයට හේතුව, සියලු හෝඩුවාවල් යොමුව ඇත්තේ පොලිසිය ක්‍රියා කිරීමට අකැමති දිසාවකට වීමයි. මරියදාස් කෙරෙහි මිලිටරියේ ආකල්පය, ඔහුගේ මරනයෙන් පසුව එහි හැසිරීමෙන් පැහැදිලි වේ. මුල්ලිපොතනේ ආරක්ෂක කටයුතුවල නිරත වූවන් ප්‍රදේශවාසීන්ට පවසා ඇත්තේ ඔවුන්, කොටියෙකු (එල්ටීටීඊ සාමාජිකයෙකු) මියයාම පිලිබඳව ශෝකයට පත් නොවිය යුතු බවයි. මරියදාස්ගේ උපන් ගම වන ත්‍රිකුනාමලයේ සෙල්වනායගපුරම් හි ඔහුගේ අවමංගල්‍යයට පැමිනි පිරිස්වලට තර්ජනය කර, පොලිසිය හා හමුදාව ඔවුන් ආපසු හරවා යැවූහ.

ආරක්ෂක හමුදාවන්ගේ බාධා කිරීම් මධ්‍යයේ දෙමල මුස්ලිම් හා සිංහල ජනතාව සියගනනක් අවමංගල්‍යයට සහභාගි වූහ. මරියදාස් මුල්ලිපොතනෙහි මෙන්ම ත්‍රිකුනාමලයෙහිත් ප්‍රකට පුද්ගලයෙකි. 2001 වසරේ පටන් සසපයේ ආධාරකරුවෙකු ලෙස ඔහු, එල්ටීටීඊයේ ද කොලඹ ආන්ඩුවේ මෙන් ම යුද්ධයේ ද ප්‍රකට විරුද්ධවාදියෙකු විය. නිදහසේ පටන් ම රටේ ජන ජීවිතය විසගැන්වූ හා දිග් ගැස්සුනු සිවිල් යුද්ධයට මග හෙලිකල ජාතිවාදයටත් වර්ගවාදයටත් ඔහු, ගැඹුරෙන්ම සතුරු විය.

සසපය යලි වතාවක් සිය ආධාරකරුවන්ගෙන් හා ලෝසවෙඅ පාඨකයන්ගෙන් ඉල්ලා සිටින්නේ මරියදාස්ගේ ඝාතකයන් අල්ලා දඬුවම් පමුනුවන ලෙස බල කරමින් රටේ බලධාරින් වෙත විරෝධතා ලිපි යොමු කරන ලෙස ය.

අපගේ උද්ඝෝෂනය, ශ්‍රී ලංකාවේත් ජාත්‍යන්තරවත් ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරයන්ට එරෙහිව වැඩ කරන ජනතාව එකමුතු කරන පුලුල් අරගලයක කොටසකි.

ලිපි හා ප්‍රකාශන යැවිය යුත්තේ ඃ-

පොලිස්පති වික්ටර් පෙරේරා,
පොලිස් මූලස්ථානය,
කොලඹ 1, ශ්‍රී ලංකාව.
ෆැක්ස්ඃ 0094112446174
ඊමේල්ඃ igp@police.lk

නීතිපති කේ.සී. කමලසබේසන්,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොලඹ 12, ශ්‍රී ලංකාව.
ෆැක්ස්ඃ 0094112436421

පිටපත් (ශ්‍රී ලංකාව) සමාජවාදී සමානතා පක්ෂය හා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වෙත යැවිය යුතු ය.

සමාජවාදී සමානතා පක්ෂය,
තැ.පෙ.1270,
කොලඹ, ශ්‍රී ලංකාව.
ඊමේල්ඃ wswscmb@sltnet.lk

© www.wsws.org